# ලංකාවිත්ති
# LANKA VITHTHI

මවත් මව්බිමත් ස්වර්ගයට වඩා උතුමිය!
Mother and Motherland are nobler than Heaven

FOR FREE CIRCULATION
නොමිලේ බෙදාහැරීම පිණිසයි
VOLUME 11
NUMBER 06

ලොව කොතැනවුව වෙසෙන සිංහලයින් සඳහා ලන්ඩනයේ මුද්‍රිත සිංහල පුවත් පත
SINHALA LANGUAGE NEWSPAPER PUBLISHED IN LONDON FOR THE SINHALA READERS WHEREVER THEY ARE.

**SEPTEMBER 10, 2008 සැප්තැම්බර් මාසය (බුද්ධ වර්ෂ 2552 බිනර මාසය)**





*Photograph* - Hiranya Malwatte........ ඡායාරූපය - හිරණ්‍ය මල්වත්ත - *Sri Lanka*

# වෙඩි කෑ කොටියා



**The Price of Freedom is Eternal Vigilance ! - Thomas Jefferson -** ***The third President of the United States*** **(1801-1809)**

***නිදහස සඳහා ජනතාව ගෙවිය යුතු මිළ නම් නිරන්තරව සුපරීක්ෂාකාරීව සිටීමයි.***

මෙසේ පැවසුවේ ඇමරිකා එක්සත් ජනපදයේ තුන්වන ජනාධිපතිවරයාවූත්, දේශපාලන දාර්ශනිකයෙකුවූත් **තෝමස් ජෙපර්සන්** ය. වසර දෙසීයකට වඩා පැරණි ඒ කියමන අද දවසට ද මනාව ගැලැපේ. කොටි ත්‍රස්තවාදයෙන් පීඩාවට පත් ශ්‍රීලංකාවට මෙය විශේෂයයි සිතමි.

ඉඳ විඳ සොඳුරු පැටි විය අද නුඹ ඉඳිනා
එද වැටහුණේ නැත'පට අගයක් එදිනා
අද වැඩිහිටිව දුක මිස මොන සැප විඳිනා?
මඳ හස නුඹෙ දකින සිත එ දුකින් මිදුනා

**The tender playful age you delight in now**
**We too had, yet could'nt grasp its worth anyhow**
**What comfort is there in being adults today**
**Your slight smile keeps our hidden woes at bay**

♦ ***දයා ආනන්ද රණසිංහ*** ♦ ***Daya Ananda Ransinghe***

මෙම සටහන ලියන අද (30) උදයේ කොළඹ පිට කොටුවේ ඕල්කොට් මාවතේ එම ජනාකීර්ණ පාරේ බෝගහ අසළ කුඩා කඩයක කොටි බෝම්බයක් තබා තිබී එය පිපිරීයාමෙන් 45 දෙනෙකු තුවාල ලැබූ බව සැළවිය. ආරක්ෂක හමුදා ප්‍රහාරවලින් පරාජය ලබන, වියරු වැටුණු කොටියාගේ හැසිරීම එයයි. මේ පිළිබඳව අපි මේ පුවත්පතින් ලංකා ජනතාවට සුපරීක්ෂාකාරීවීමේ සහ ප්‍රවේශම් වීමේ වැදගත්කම නිතර පැහැදිලි කළෙමු. ගියවර පුවත්පතේ අප දැක්වූයේ ද මින් එහාට යන ගමන විමසිල්ලෙන් කළ යුතු බවයි. එම විමසිලිමත්වීම යුද්ධය වැනි දරුණු ආපදා කාලවලදී අත්‍යවශ්‍යවූවකි.

ශ්‍රීලංකා ආරක්ෂක හමුදාවෝ සාර්ථකව සිය මෙහෙයුම් කාර්යයන් සිදුකරමින් සිටිති. කොටි ත්‍රස්තයින්ට කිසි ඉඩක් නොදෙන සේ හැම පැත්තෙන්ම උන් වට කිරීම දැන් අරඹාඇත. ආරක්ෂක හමුදා කුඩා සේනාංකවලට බෙදී එක් එක් දිශාවෙන් කොටි මූලස්ථානය වෙත ක්‍රමානුකූලව ගමන් අරඹා සිටිති. ඇතැම් කොටි බංකර් හිස්ය. බඩු බාහිරාදිය තැනතැන දමා ත්‍රස්තයින් පණ බේරාගෙන දුව ගිය ලකුණු හොඳින් පෙනෙන්නට ඇත.

බ්‍රිගේඩියර් ශවීන්ද්‍ර සිල්වාගේ මෙහෙයුම් යටතේ කිලිනොච්චි ප්‍රධාන දිස්ත්‍රික්කයට ඇතුල් වූ ආරක්ෂ හමුදාවේ 58 වන සේනාංකය කොටින්ගේ භූමි ප්‍රදේශයෙන් විශාල ප්‍රමාණයක් අල්ලා ගනිමින් සාර්ථකව ඉදිරියට ගොස් සිටිති. මේ සටන්වල දී කොටි සාමාජිකයින් බොහෝ ගණනක් මියගොස් ඇත. මේ ප්‍රදේශයේදී කොටින් මුහුණ දෙන දරුණුම සටන් ඉදිරි දිනවල දී පවතිනවා ඇතියි නිරීක්ෂණය කර තිබේ.

පසුගිය අවුරුදු දෙක තුළ කලින් වතාවල මෙන් නොව රජය හා හමුදා සේනාංක මෙම ත්‍රස්තවාදී යුද්ධය අවසන් කරන නියායෙන් සෑජුවම සටනට පිවිස සිටින බව අපි දනිමු. මේ වසර දෙක තුළ අප රණවිරුවෝ උතුරු නැගණ හිර කැලැවන් පීරමින් සතුරා සමග කළ සටන් නිසාම හා ඒ මෙහෙයවන නායකයින්ගේ උපක්‍රමශීලී සටන් ක්‍රියාදාමයන් නිසාම ඉතිහා- සයේ මින් පෙර කිසිදාක නොවූවිරූ පරිදි සටන් පන්නරය ලබා සිටිති. ගරිල්ලා සටනට දැන් අප හමුදාවන්ට අවශ්‍ය ඥාණය හා දැනුම ඇත. එසේම අප හමුදා භට පිරිස්හි චිත්ත ධෛර්‍ය්‍ය ඉතා ඉහල මට්ටමක පවතී. ඔවුහු දැන් සැබෑ රණකාමීන්ව සිටිති. මේ සියල්ල කොටි ත්‍රස්ත වාදීන්ගේ පරිහානියට හේතුවී ඇත. පසුගිය කාලසීමාව තුළ හමුදා අත්පත් කරගත් ජයග්‍රහණයන්ගෙන් මේ බව මනාව ඔප්පුවේ. එහෙත් දරුණුම අවස්ථාව ඇත්තේ තව ඉදිරියට ය.

වව්නියාව හා මන්නාරම ඒකාබද්ධ ක්‍රියාන්විතයේ නිරතව සිටින සෙබළ පිරිස් එහි ඝන වනාන්තරයට පිවිස සිටින්නේ විශාල මලු පිටෙහි දරා, දෑතේ ආයුධ හා උණ්ඩ වලින් සන්නද්ධවය. කොටි ත්‍රස්තයින් සොයා යන ඔව්හු නිබයවම උන් හා මුහුණට මුහුණ දී සටන් කරති. මීට පෙර ඈත සිට සතුරාට පහර දුන් නමුත් දැන් කොටියා තම නිල රාජ්‍යය වශයෙන් නම්කර ඇති කිලිනොච්චියට ආරක්ෂක හමුදා පිවිස සිටින්නේ සතුරාගේ ගෙයි එළිපත්තටමය. මෙම නිබය ඉදිරි ගමන කොටින්ගේ ඉරණම නිසැකවම තීන්දු කිරීමක් බව දැන් කොටි පමණක් නොව කොටි හිතවාදී ද්‍රවිඩයෝ ද දනිති. දැන් කොටියාට ගැළවුමක් නැත.

එහෙත් වැටෙන්නට යන කොටියා කෙලින් කරන්නට සැරසෙන පිරිස් ද ලංකාව ඇතුළතම සිටිති. ඒ ප්‍රතිගාමී බලවේග ක්‍රියාකරන්නේ විවිධ මට්ටමෙනි. මෙතැන කොටස් දෙකකි.

එක් කොටසක් කොටියා පරාජය නොකර හමුදා මෙහෙයුම් නවතා කොටියා සමග සාකච්ඡා කළ යුතුයයි කියන පිරිසකි. ඔවුන්ගේ වෑයම පවතින රජය පෙරළා ආණ්ඩු බලය ලබාගැනීම ය. ඒ සඳහා ඔව්හු ජනතාව අවුස්සන පෙළපාලි හා උද්ඝෝෂණ සංවිධානය කරති. මේ උද්ඝෝෂණ මගින් රජය අප්‍රසාදයට පත්කිරීම හා පොලීසිය ලවා උද්ඝෝෂකයින්ට පහරගස්සවා ගෙන එය රජය ජනතාවට පහර දුන් බවට නරක නාමයක් ගෙන ඒම ය. මේ කළබැගෑනි සියල්ල කොළඹ පනවා ඇති ආරක්ෂක වැඩ පිළිවෙල කඩාකප්පල් කිරීම ය. මෙය කොටින්ට බෝම්බ පිපිරවීමට හොඳ අවස්ථාවක්ද වන්නේ ය.

අනෙක් කොටස කොටින්ගේ මුදලින් යැපෙන ප්‍රතිගාමී මාධ්‍යකාරයින් ය. ඔවුන්ගේ කාර්‍ය්‍යය උතුරු නැගණහිර ක්‍රියාන්විතයේ යෙදී සිටින රජයේ සේනාංක අවතක්සේරු කිරීම හා හමුදා නායකයින් ගැන විවිධ කතා පැතිරවීමය.

මේ කුමන බලවේග හරස් වුවද අපේ වීරෝදාර හමුදාවන් අතින් කොටියා විනාශවීම කිසිසේත් වැළැක්විය හැක්කක් නොවේ. දැන් කළ යුත්තේ වෙඩි කා පණ අදින කොටියාට ජීවන හුස්ම පිඹීම නොව, තව වෙඩිල්ලක් තබා ඌ යළි නේන ලෝකයට යැවීම ය.

♦ ***සංජය විමලරත්න***

ලංකාවිත්ති වෙබ් අඩවිය Lanka Viththi Website http://www. lankaheritage.com/lankaviththi/







විස්තර පිටු අංක 3